# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2073/36 – 2018 මැයි 31 වැනි බ්‍රහස්පතින්දා – 2018.05.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2018 අංක 103 දරන ආඥාව**

*මගේ යොමු අංකය:* 4-3/7/2016/එච්ඩබ්ලිව්/307.
*ප්‍රාදේශීය ලේකම්ගේ අංකය:* 3/1/83/2016.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2018 මැයි මස 22 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'' අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.** – ප්‍රාදේශීය ලේකම්, රිදීගම.

2. **ඉඩමේ විස්තරය.**– වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 551, රත්විට සහ 552, ගොපල්ලව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වැදිපොල, පෙතන්ගල්ල ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක කේයූ/ආර්ඩීජී/2016/703 හා 2016.10.26 දිනැති පූර්වගමන අනුරේඛනයේ පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබැල්ලට මායිම් :

01. **කැබලි අංක 133 – කහටගහ කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0145**
උතුරට: කේ. එම්. සුනිල් බන්නැක හිමිකම් කියන කහටගහකුඹුර සහ එච්. එම්. පී. එස්. බණ්ඩාර හිමිකම් කියන මයිලගහකුඹුර; නැගෙනහිරට: කැබලි අංක 132 සහ 129; දකුණට: කැබලි අංක 129 සහ වැදිපොල ඇළ; බටහිරට: කේ. එම්. එස්. බන්නැක හිමිකම් කියන කහටගහකුඹුර සහ කේ. එම්. සුනිල් බන්නැක හිමිකම් කියන කහටගහකුඹුර.

06 - 655

1A – G27774 – 32 (2018/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*